රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 225

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 7.
1983 සැප්තැම්බර් මස 8 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් වෙතයි.

## මෑතක දී ඇති වූ කලබල වලින් පසුව නැවත සේවයට පැමිණීම

මෑතක දී ඇති වූ කලබල නිසා සේවයට වාර්තා කර නැති සියළුම රජයේ නිලධරයන් හා රාජ්‍ය සංස්ථා සේවකයින්, 1983 සැප්තැම්බර් මස 15 වැනි දින හෝ ඊට පළමුව හෝ රාජකාරි සඳහා තම සේවා ස්ථාන වලට වාර්තා කළ යුතුයි.

2. එසේ රාජකාරි සඳහා වාර්තා කිරීමට අපොහොසත් වන එවැනි යම් කෙනෙක් ඇත්නම්, ඔහු එසේ කිරීමට අපොහොසත්වීමට හේතු දක්වමින් තමාගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාට ලිඛිතව දැන්විය යුතුයි.

3. දක්වන හේතු පිළිබඳව තමා පුද්ගලිකව සෑහීමකට පත්වන්නේ නම්, දුෂ්කරතා ඇති අවස්ථාවලදී, දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියෙකුට පසුදිනෙක සේවය සඳහා වාර්තා කිරීමට විශේෂ අවසර දිය හැකිය. මේ සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් අනුගමනය කළයුතු පිළිවෙල ගැන ඔහු අමාත්‍යාංශ ලේකම්ගෙන් උපදෙස් ලබාගත යුතුයි.

4. 1983 ජූලි මස 25 වැනි දින හෝ ඊට පසු දිනක හෝ වන අවසාන වශයෙන් සේවයට වාර්තා කළ දිනයේ සිට, 1983 සැප්තැම්බර් මස 15 වැනි දින දක්වා (එසේ නැතිනම් 3 වන ඡේදය යටතේ නිවාඩු දීර්ඝ කිරීමක් වලංගු වන දිනය දක්වා) විශේෂ පූර්ණ වැටුප් සහිත නිවාඩු වශයෙන් සැළකිය යුතුය.

Siriwardhana
(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන)
ලේකම්
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

සී/08.